00037

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම 2014/2015**

**අවසාන පරීක්ෂණය - 2016**

**ළමා අයිතිවාසිකම් – ESU3130**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2016 අප්‍රේල් 09** **වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු ළමයින්ගේ තත්ත්වය ඉහළ නංවාලීමට රජය ගත් ක්‍රියාමාර්ග පහක් (05) කෙටියෙන් දක්වන්න.

02. "ළමයින්ට වෙන්කොට නොසැලකිය යුතුය" යන වගන්තිය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ළමයාගේ පැවැත්ම සහතික කිරීම සඳහා, ශ්‍රී ලංකාව තුළ මව්කිරි දීම ප්‍රවර්ධය වෙනුවෙන් ගන්නා ලද පියවර තුනක් (03) ක් කෙටියෙන් සඳහන් කරන්න.

04. ක්‍රීඩා හා විවේකය සඳහා අයිතීන් අහිමි වූ ළමයින් වර්ග පහක් (05) නම් කරන්න.

05. පාසල තුළදී ළමයින්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම සඳහා ගුරුවරයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග පහක් (05) ලියන්න.

06. ළමා අයිතිවාසිකම් පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික මෙහෙයුම් කමිටුව ඉදිරිපත් කර ඇති යෝජනා පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා ගත හැකි උචිත සන්නිවේදන උපාය මාර්ග තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

08. උදැසන පාසල ආරම්භවීමට පෙර ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගුරුවරයෙකුට දැරිය හැකි වගකීම් පහක් (05) ලියන්න.

(ලකුණු 5 x 8 = 40)

0003

## II වන කොටස

09. (i) ජීවත්වීමේ අයිතිය යනු කුමක් ද? (ලකුණු 04)

(ii) ජීවත්වීමේ අයිතියට අදාළව ළමයින් මුහුණ පාන ගැටලු තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඔබ ඉහත (ii) හි සඳහන් ගැටලු විසඳීමට ගත හැකි පියවර උදාහරණ සමග විස්තර කරන්න. (ලකුණු 10)

10. (i) "ළමා අයිතිවාසිකම් සම්මුතිය" යනු කුමක්දැයි හඳුන්වා එහි සඳහන් අයිතිවාසිකම් කාණ්ඩ හතර (4) නම් කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාව තුළ ළමා අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු සපයා ගත හැකි ප්‍රධාන මූලාශ්‍ර තුනක් (03) නම් කර එම මූලාශ්‍ර වල වැදගත්කම පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ලෝකයේ රටවල් වල ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීම සඳහා ළමා අයිතිවාසිකම් සම්මුතියේ යෝජිත ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

11. (i) ශ්‍රී ලංකාවේ දැනට ස්ථාපිතව ඇති ළමා සුරක්ෂණ අධිකාරිය පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

(ii) එම අධිකාරිය විසින් කරනු ලබන ප්‍රධාන කාර්යයන් තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඔබ ඉහත සඳහන් කළ කාර්යයන් වඩා සාර්ථක කර ගැනීමට රජයට ගත හැකි පියවර යෝජනා කරන්න. (ලකුණු 10)

12. (i) "අභ්‍යන්තරික අවතැන් වූ දරුවන්" යනු කවුරුන් ද? (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරව අවතැන් වූ ළමයින් තුළ දක්නට ලැබිය හැකි සුවිශේෂී ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ ළමයින් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත්, අවතැන් වූ ළමයින්ගේ සුභ සාධනය සඳහා වන වැඩසටහන් හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 12)

13. (i) ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රජාව දැනුවත් වීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමට ගත හැකි ක්‍රමෝපායන් තුනක් (03) සාකච්ඡා කරන්න. (ලකුණු 12)

14. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක් (02) සඳහා සටහන් ලියන්න.

i. අතීත ලංකාවේ ළමා අයිතිවාසිකම්
ii. ළමා අයිතීන් සඳහා පාදක වන ප්‍රධාන මූලධර්ම
iii. ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජනය වලක්වා ගැනීමට ගත හැකි පියවර
iv. ළමා අයිතිවාසිකම් සුරැකීමට අදාලව ජනමාධ්‍ය සතු වගකීම

(ලකුණු 10 x2 = 20)

හිමිකම් ඇවිරිණි.